වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

# Annual Report

2022

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

அரசகரும மொழிகள் ஆணைக்குழு

## OFFICIAL LANGUAGES COMMISSION



# පටුන


පිටු අංක

හැඳින්වීම 03

I කොටස 04-09

- දැක්ම
- මෙහෙවර
- අරමුණු
- ප්‍රධාන කාර්යයන්
- සංවිධාන ව්‍යුහය
- කොමිෂන් සභා රැස්වීම්
- භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP) සමඟ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්
- වෙබ් අඩවිය දියත් කිරීම

II කොටස 10-19

- 2022 වර්ෂය තුළ කොමිෂන් සභාව මගින් ඉටු කළ ක්‍රියාකාරකම්
- 2022 වර්ෂයෙහි ක්‍රියාත්මක කරන ලද නව වැඩසටහන්
- 2022 වර්ෂයෙහි ක්‍රියාකාරකම් දියත් කිරීමේ දී පැවැති අභියෝග

III කොටස - මූල්‍ය තොරතුරු 20- 48

- වාර්ෂික මූල්‍ය තොරතුරු
- විගණකාධිපති වාර්තාව

# හැඳින්වීම

.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවෙහි පළමුවන කොටසෙහි කොමිෂන් සභාවෙහි දැක්ම, මෙහෙවර, අරමුණු සහ සාමාජිකයන් පිළිබඳ තොරතුරු, කාර්යමණ්ඩල තොරතුරු සමඟ පරිපාලනයට අදාළ කරුණු ඇතුළත්ය

1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි අරමුණු 4ක් ඇත. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අධීක්ෂණය, විමර්ශනය, අධ්‍යාපනය සහ උපදේශනය යන ප්‍රධාන කාර්යයන්ට අදාළව භාෂා විගණන පැවැත්වීම, මහජන පැමිණිලි විමර්ශනය, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ රජය වෙත නිර්දේශ ලබාදීම ආදී ක්‍රියාකාරකම් සිදුකරයි. එම ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ දෙවන කොටසෙහි ඇතුළත්වේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සහ එම කාලයට අදාළ වන විගණකාධිපතිගේ නිරීක්ෂණ ඇතුළත් අවසන් විගණන වාර්තාව මෙම වාර්තාවෙහි තුන්වන කොටසේ ඇතුළත් වේ.

# I කොටස

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි විධිවිධානවලට අනුකූලව ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.**

## දැක්ම

මහජනයා වෙත සේවය සපයනු ලබන සියලු ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බලගැන්වූ ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශනය, අධීක්ෂණය, අධ්‍යාපනය සහ උපදේශනය මගින් මහජනතාවගේ ද්විභාෂාමය අවශ්‍යතා සැපයීම.

## අරමුණු

**කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.**

**(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත් වීම හා අධීක්ෂණය කිරීම.**

**(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූලව සිදුවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම.**

**(ඇ) රාජ්‍ය භාෂා ඇගයීම, දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම.**

**(ඈ) සිය මෙහෙයවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධාන වලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.**

## ප්‍රධාන කාර්යයන්

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න ගැන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය පිළිබඳව දැනුවත් කිරීම | ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය |
| ↓ | ↓ | ↓ | ↓ |
| අධීක්ෂණය | විමර්ශනය | අධ්‍යාපනය | උපදේශනය |






## සංවිධාන ව්‍යුහය


රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පත්කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. කොමිෂන් සභාව සාමාජිකයන් හයදෙනෙකුගෙන් සමන්විත වේ. එක් සාමාජිකයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කරනු ලබයි. සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ.

**2020/01/22 දින පත් කරන ලද කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.**

1. නීතිඥ ඩී. කලංසූරිය මහතා (සභාපති)
2. මහාචාර්ය සඳගෝමි කෝපරහේවා මහතා (කොළඹ විශ්ව විද්‍යාලය)
3. මහාචාර්ය රදිරාණි යෝගේන්ද්‍රරාජා මහත්මිය (යාපනය විශ්ව විද්‍යාලය)
4. මහාචාර්ය දුෂ්‍යාන්ති මෙන්ඩිස් මහත්මිය (කොළඹ විශ්ව විද්‍යාලය)
5. ආචාර්ය කවිතා රාජරත්නම් මහත්මිය (කැළණිය විශ්ව විද්‍යාලය)
6. වසන්ත ඒකනායක මහතා (හිටපු ලේකම් - සංස්කෘතික, කලා සහ බුද්ධශාසන අමාත්‍යාංශය)

මෙම කාල සීමාව සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (1) වන පන්තියේ නිලධාරිනියක වන රාජ්‍ය භාෂා කොමසාරිස් සැනෝජී රුවිනිකා පෙරේරා මහත්මිය නිල බලයෙන් කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලදි.

## 2022/12/31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යුහය



## 2022.12.31 දින වනවිට කොමිෂන් සභාවේ සේවය කළ කාර්ය මණ්ඩලය

| අනු අංකය | නිල නාමය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | සටහන |
|---|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ | 01 | - | පුරප්පාඩු 01 |
| 02. | සහකාර අධ්‍යක්ෂ | 01 | 01 | |
| 03. | භාෂා නිලධාරි | 03 | 01 | පුරප්පාඩු 02 |
| 04. | පරිපාලන නිලධාරි | 01 | 01 | |
| 05. | මූල්‍ය නිලධාරි | 01 | - | පුරප්පාඩු 01 |
| 05. | ප්‍රධාන ලිපිකරු | 01 | 01 | |
| 06. | භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරි | 10 | 04 | පුරප්පාඩු 06 |
| 07. | සංවර්ධන නිලධාරි | 04 | 03 | පුරප්පාඩු 01 |
| 08. | කළමනාකරණ සහකාර | 10 | 08 | පුරප්පාඩු 02 |
| 09. | භාෂා පරිවර්තක (දෙමළ/ ඉංග්‍රීසි) | 01 | - | පුරප්පාඩු 01 |
| 10. | භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි) | 01 | - | පුරප්පාඩු 01 |
| 11. | භාෂා පරිවර්තක(සිංහල/ දෙමළ) | 01 | - | පුරප්පාඩු 01 |
| 12. | රියදුරු | 03 | 02 | පුරප්පාඩු 01 |
| 13. | කාර්යාල කාර්ය සහායක | 04 | 03 | පුරප්පාඩු 01 |
| | මුළු සංඛ්‍යාව | **42** | **24** | **පුරප්පාඩු 18** |

## කොමිෂන් සභා රැස්වීම්

| රැස්වීම් දිනය |
|---|
| 2022.01.31 |
| 2022.02.28 |
| 2022.03.15 |
| 2022.04.29 |
| 2022.05.26 |
| 2022.06.28 |
| 2022.07.27 |
| 2022.08.30 |
| 2022.10.25 |
| 2022.10.28 |
| 2022.11.03 |
| 2022.12.01 |
| 2022.12.14 |



## ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය ( NLEAP) සමඟ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

**I. පාසල් ළමුන් සඳහා වෙන් කරන ලද දීප ව්‍යාප්ත රචනා තරඟයේ සහතිකපත් ප්‍රධාන උත්සවය පැවැත්වීම.**

2021 වර්ෂයේ දී පාසල් ළමුන් සඳහා දීප ව්‍යාප්ත රචනා තරඟයක් පවත්වන ලදී. මෙම රචනා තරඟය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පවත්වන ලදී.





*රචනා තරඟයේ සහතිකපත් ප්‍රදානය*

**II. පර්යේෂණ ක්‍රමවේද සහ සමීක්ෂණ පිළිබඳ ආරම්භක වැඩමුළුව පැවැත්වීම.**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි නිලධාරීන්ට පර්යේෂණ ක්‍රමවේද සහ සමීක්ෂණ සම්බන්ධයෙන් දැනුම පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වේ. මෙයට හේතුව වන්නේ කොමිෂන් සභාව මඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විවිධ සමීක්ෂණ පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය කොමිෂන් සභා නිර්දේශ පිළියෙළ කිරීම සඳහා අත්‍යාවශ්‍යවීමයි. ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය ( NLEAP) මගින් ආරම්භ කරන ලද මෙම වැඩමුළුව මඟින් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ පර්යේෂණ සහ සමීක්ෂණ පිළිබඳ ධාරිතා වර්ධනය අපේක්ෂා කරයි.

**III. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව දැනුවත්කිරීම.**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව එක්දින වැඩමුළුවක් පවත්වන ලදී. එමෙන්ම කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ක්‍රියාකාරකම් දියත් කිරීම සඳහා කේන්ද්‍ර නිලධාරීන් පත් කෙරිණි.

**IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ විමර්ශන අත්පොත නිර්මාණය කිරීම.**

රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ ඇතුළත් විධිවිධාන පරිදි පැමිණිලි විමර්ශනය කිරීමේ ක්‍රමවේදය සවිස්තරාත්මකව අවශ්‍ය ආකෘති ද ඇතුළත්ව විමර්ශන අත්පොතක් වශයෙන් නිර්මාණය කිරීම මෙම වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම අත්පොත නිර්මාණය කිරීම සඳහා සම්පත් දායකත්වය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය එන්. සෙල්වක්කුමාරන් මහතා විසින් ලබාදෙනු ලබයි. අත්පොත නිර්මාණය කිරීමට අදාළ පළමු සාකච්ඡාව මෙම වර්ෂයේ දී පවත්වන ලද අතර සම්පත්දායකයා විසින් අත්පොත නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## වෙබ් අඩවිය දියත් කිරීම




රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි වෙබ් අඩවිය අක්‍රිය තත්ත්වයක පැවතුනි. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ කොමිෂන් සභාව ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියෙහි ( NLEAP ) සහාය ඇතිව 2021 වර්ෂය තුළ දී වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කර 2022 ජනවාරි 12 වැනි දින දියත් කරන ලදී.

වෙබ් අඩවිය දියත් කිරීම රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් සහ කැනේඩියානු මහ කොමසාරිස්වරයාගේ සහභාගීත්වයෙන් 2022 ජනවාරි 12 වැනි දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

මෙම අවස්ථාව සඳහා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ. රත්නසිරි මහතා, කොමිෂන් සභා සාමාජික වසන්ත ඒකනායක මහතා, මහාචාර්ය සඳගෝමි කෝපර හේවා මහතා, මහාචාර්ය දුෂ්‍යන්ති මෙන්ඩිස් මහත්මිය සහ ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියෙහි ( NLEAP ) ව්‍යාපෘති අධ්‍යක්ෂ ඩෙනල්ඩ් ඊ බ්‍රවුකෙල් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ තිරුනාවුකරසු මහතා සහ මල්රාජි වන්නි ආරච්චි මහත්මිය සහභාගි විය.

වෙබ් අඩවිය මගින් භාෂා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව වෙත තොරතුරු ලබාදීමේ හැකියාවක් ඇත. එමෙන්ම කොමිෂන් සභාවේ ප්‍රකාශන, වාර්තා, වාර්ෂික වාර්තා සහ සිදු කරනු ලබන වැඩසටහන්වලට අදාළ තොරතුරුද මහජනතාව වෙත කාර්යක්ෂමව ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඇත. අමතර වශයෙන් භාෂා අයිතිවාසිකම් උල්ලංඝනයවීම සම්බන්ධයෙන් වෙබ් අඩවියෙහි චැට් බොට් (Chat Bot ) මගින් මහජන පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාවක්ද පවතී.






*වෙබ් අඩවිය දියත් කිරීම.*

# II කොටස

## 2022 වර්ෂය තුළ කොමිෂන් සභාව මගින් ඉටු කළ ප්‍රධාන ක්‍රියාකාරකම්

කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් වන අධීක්ෂණය, විමර්ශනය, අධ්‍යාපනය/දැනුවත් කිරීම සහ උපදේශනයට අදාළ පහත දැක්වෙන ක්‍රියාකාරකම් මෙම වර්ෂය තුළ දී ඉටු කර ඇත.

1. **අධීක්ෂණය** ⟶ භාෂා විගණන/ දුම්රිය ස්ථානවල නිවේදන පරීක්ෂාව/ විශේෂිත සමීක්ෂණ පැවැත්වීම.
2. **විමර්ශනය** ⟶ මහජන පැමිණිලි සහ සිය මෙහෙයවීමෙන් සොයාගන්නා භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම.
3. **අධ්‍යාපනය/දැනුවත් කිරීම** ⟶ මහජනතාව, රාජ්‍ය නිලධාරීන්, අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහ පාසල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
4. **උපදේශනය** ⟶ රජය වෙත නිර්දේශ ලබාදීම.

## 1. අධීක්ෂණය

### ❖ භාෂා විගණන පැවැත්වීම.

රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා භාෂා විගණන පවත්වනු ලැබිණි. භාෂා විගණන සඳහා ආයතන තෝරා ගැනීමේ දී පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලදී.

- මහජනතාව වෙත සේවාවන් සැපයීම.
- ආයතනය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජන සංයුතිය
- පෙර වර්ෂවලදී භාෂා විගණන සිදු කර තිබීම.
- මහජන පැමිණිලි ඉදිරිපත්වී ඇති ආයතන
- කොමිෂන් සභාව මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති ආයතන
- විශේෂිත සේවාවන් සපයන ආයතන

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය ආයතන මහජනතාව වෙත සේවය ලබාදෙන්නේද යන්න සම්බන්ධයෙන් භාෂා විගණනවලදී පරීක්ෂාවට ලක් කරන ලදී.

**මෙම පරීක්ෂාව සඳහා පහත දැක්වෙන නිර්ණායක භාවිතා කරන ලදී.**

1. ආයතන පරිශ්‍රයේ මහජන ප්‍රදර්ශනය සඳහා තබා ඇති සියලුම පුවරු. (නාම පුවරු, තොරතුරු පුවරු, උපදෙස් පුවරු)
2. මහජන සේවය සඳහා භාවිතා කරනු ලබන සියලුම ලේඛන.
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත්භාවය.
4. නිලධාරීන්ගේ ද්වි භාෂා හැකියාව.
5. සිංහල/ දෙමළ පුහුණු පාඨමාලා පැවැත්වීම.
6. නිලධාරින්ගේ භාෂා ප්‍රවීණතාව.
7. වෙබ් අඩවිය.
8. පරිවර්තන කටයුතු.
9. පිවිසුම් කාර්යාල පසුබිම.
10. ආයතනයට අදාළ විශේෂිත කරුණු (උදා-: පොලිස්ථාන - පැමිණිලි සටහන් කිරීම උප්පැන්න/ විවාහ/ මරණ රෙජිස්ට්‍රාර් - සහතිකපත්‍ර රාජ්‍ය භාෂාවලින් ලබාදීම.)

ඉහත නිර්ණායකවලට අනුව දත්ත රැස් කිරීම සඳහා භාෂා විගණනවලදී ප්‍රශ්නාවලි උපයෝගී කරගනු ලැබිණි. ඊට අමතරව ස්ථානීය නිරීක්ෂණ ( නාම පුවරු, තොරතුරු පුවරු) සිදු කර අවශ්‍ය ඡායාරූප ලබාගැනීම , නිලධාරින් හමු වී තොරතුරු ලබාගැනීම, ආයතනය තුළ පිහිටි අංශ පරීක්ෂා කිරීම, භාෂා විගණනවලදී සිදු කරන ලදී.

භාෂා විගණන සංවිධානය කිරිමේ දී තෝරා ගන්නා ලද ආයතන වෙත දැනුම් දී දින වෙන් කරගන්නා ලදී. මෙසේ පූර්ව දැනුම්දීම් සිදු කරනු ලබන්නේ විගණනය කරනු ලබන ආයතනය තුළ තොරතුරු ලබාගැනීම සඳහා පූර්ව සූදානමක් ඇති කිරිමටය. විගණනය සඳහා කොමිෂන් සභාවේ භාෂා නිලධාරි සහ භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සහභාගි වූ අතර 2022 වර්ෂයේ දී සිදු කරන ලද භාෂා විගණන පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

| අනු අංකය | ආයතනයේ නම | දිනය |
|---|---|---|
| 1. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කළුතර | 2022/01/25 |
| 2. | ලංකා බැංකුව - කළුතර | 2022/01/26 |
| 3. | මහජන බැංකුව - කළුතර | 2022/01/26 |
| 4. | පොලිස් ස්ථානය - කළුතර දකුණ | 2022/01/26 |
| 5. | දක්ෂිණ අධිවේගී මාර්ගය | 2022/02/22 |
| 6. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හම්බන්තොට | 2022/02/23 |
| 7. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | 2022/02/23 |
| 8. | නගර සභාව - හම්බන්තොට | 2022/02/24 |
| 9. | පොලිස් ස්ථානය - හම්බන්තොට | 2022/02/24 |
| 10. | පොලිස් ස්ථානය - තිස්සමහාරාමය | 2022/02/24 |
| 11. | අතුරුගිරියේ සිට කෙරවලපිටිය දක්වා අධිවේගී මාර්ගය | 2022/09/06 |
| 12 | පැලියගොඩ සිට කටුනායක දක්වා අධිවේගී මාර්ගය | 2022/09/07 |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 2022/09/26 |
| 14 | ප්‍රධාන ලේකම් කාර්යාලය - ගාල්ල | 2022/09/27 |
| 15 | නගර සභාව - ගාල්ල | 2022/09/27 |
| 16 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල | 2022/09/27 |
| 17 | මූලික රෝහල - කරාපිටිය | 2022/09/28 |
| 18 | මීරිගම අධිවේගී මාර්ගය | 2022/11/24 |



*කළුතර පොලිස් ස්ථානය*



*ගාල්ල, කරාපිටිය මහ රෝහල*

❖ **දුම්රිය නිවේදන පරීක්ෂාව**

දුම්රිය ස්ථානවල නිවේදන භාෂා තුනෙන්ම සිදු නොකිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිතර පැමිණිලි ඉදිරිපත් වේ. මෙම තත්ත්වය නියාමනය කිරීම සඳහා දුම්රිය නිවේදන භාෂා තුනෙන්ම සිදු කරන්නේද යන්න කොමිෂන් සභාව මගින් නිරීක්ෂණය කරනු ලැබේ. මෙහි දී කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරින් දුම්රියෙහි ගමන් කරන අතර දුම්රිය නවත්වනු ලබන දුම්රිය ස්ථානවල නිවේදන සිදු කරන ආකාරය ඔවුන් විසින් සටහන් කරගනී. මෙසේ සටහන් කරගනු ලබන තොරතුරු ඇතුළත් වාර්තාවක් දුම්රිය සාමාන්‍යාධිකාරි සහ අදාළ දුම්රිය ස්ථානාධිපතිවරුන් වෙත ඉදිරිපත් කර නිරීක්ෂණ කැඳවනු ලබයි. මෙම වර්ෂයේ දී දුම්රිය ස්ථාන 136ක් මෙසේ පරීක්ෂාවට ලක් කෙරිණි.

## 2. විමර්ශනය

**කොමිෂන් සභාව විමර්ශන කාර්යය දෙයාකාරයෙන් සිදු කරයි.**

විමර්ශනය

සිය මෙහෙයවීමෙන් සොයාගනු ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම විමර්ශනය

භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධ ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය

### ❖ මහජන පැමිණිලි විමර්ශනය

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය සඳහා කොමිෂන් සභා පනත මගින් කොමිෂන් සභාව වෙත විශේෂිත බලතල හිමිවී ඇත. පැමිණිලි විමර්ශනය කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර, කොමිෂන් සභාව වෙත පහත ආකාරවලින් පැමිණිලි ඉදිරිපත් වේ.




**071-9521436 ක්ෂණික ඇමතුම් අංශය**

2022 වර්ෂයේ කොමිෂන් සභාව වෙත භාෂා අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධ මහජන පැමිණිලි 53ක් ලැබී ඇත. පෙර වර්ෂවල කොමිෂන් සභාව වෙත ලැබි, විමර්ශනය ආරම්භ කරන ලද පැමිණිලි ද ඇතුළත්ව පැමිණිලි 45ක විමර්ශන කටයුතු 2022 වර්ෂය තුළ දී අවසන් කරන ලදී. එම පැමිණිලි ලැබී ඇති වර්ෂය අනුව වර්ගීකරණය පහත ප්‍රස්තාරය මගින් පැහැදිලි වේ.

2022




**2022 වර්ෂයේ දී අවසන් කරන ලද විශේෂිත පැමිණිලි කිහිපයකට අදාළ තොරතුරු පහත වගුවෙහි ඇතුළත් වේ.**

| පැමිණිල්ල | ගත් ක්‍රියාමාර්ග |
|---|---|
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ලාංඡනයෙහි දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉවත්කර සිංහල භාෂාවෙන් පමණක් ප්‍රදර්ශනය කිරීම. | රූපවාහිනී සංස්ථාවේ සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවා නැවත රූපවාහිනී ලාංඡනය භාෂාත්‍රයෙන් සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නිල ලාංඡනය භාෂාත්‍රයෙන් නැවත සකස් කර ප්‍රදර්ශනය කරයි. |
| ලංකා විදුලිබල මණ්ඩලය මගින් විදුලිය විසන්ධි කිරීමේ රතු නිවේදනය මහජනතාව වෙත නිකුත් කරන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් වීම. | ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවා විදුලිය විසන්ධි කිරීමේ නිවේදනය භාෂාත්‍රයෙන් නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත. |
| කොළඹ මහ රෝහලට චීනයෙන් ලබා දී ඇති, තවමත් මහජනතාව සඳහා විවෘත කර නොමැති ගොඩනැගිල්ල හඳුන්වා දීම සඳහා ප්‍රදර්ශනය කර ඇති පුවරුව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් කර ඇති බව සහ එහි සිංහල සහ දෙමළ භාෂාවෙන් පුවරු සකස් කර නොමැති බව | මේ සම්බන්ධයෙන් කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂ වෙතින් නිරීක්ෂණ කැඳවා අදාළ ගොඩනැගිල්ලෙහි ප්‍රදර්ශනය කර ඇති පුවරුව සිංහල සහ දෙමළ භාෂාව ඇතුළත් කර සකස් කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. |
| මහනුවර මහනගර සභාව සතු මහනුවර වෙළඳ සංකීර්ණයේ "Mahanuawara Commercial Complex යනුවෙන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ප්‍රදර්ශනය කර ඇති බවත්, එම නාමය සිංහල සහ දෙමළ භාෂාවෙන් ද ඇතුළත් විය යුතු බව | මේ සම්බන්ධයෙන් මහනුවර මහනගර සභාවේ නාගරික කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවා අදාළ වෙළඳ සංකීර්ණයේ ප්‍රදර්ශනය කර ඇති නාමය භාෂාත්‍රයෙන් සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත. |

## 3. අධ්‍යාපනය/දැනුවත් කිරිම

මේ යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ පාර්ශවකරුවන් දැනුවත් කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 2022 වර්ෂය තුළ දී මෙම දැනුවත් කිරිම සඳහා මූලික වශයෙන් පහත දැක්වෙන පාර්ශවකරුවන් තෝරාගෙන ඇත.

I. ආයතන ප්‍රධානීන් (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්)
II. මහජනතාව වෙත විශේෂිත සේවාවන් සපයනු ලබන රාජ්‍ය දෙපාර්තමේන්තුවල නිලධාරීන්
III. භාෂා විගණන සිදු කරන ලද ආයතනවල නිලධාරීන් ( පොලිස් ස්ථාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල)
IV. අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්
V. මහජනතාව
VI. පාසල් සිසුන්

දැනුවත් කිරිමේ වැඩසටහන්වලදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරින් දැනුවත් කරනු ලබන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව නිලධාරින්ගේ නෛතික බැඳීම පිළිබඳවයි. නිලධාරීන් අයත් වන්නේ සේවා සැපයුම් අංශයේ පාර්ශවකරුවන් ලෙසය. සේවාලාභීන් ලෙස මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු කරනු ලැබේ. මෙහි දී විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ පුරවැසියන් වශයෙන් ඔවුන්ට ඇති භාෂා අයිතිවාසිකම් පිළිබඳවය.

රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරිමේ දී වැඩමුළු, සම්මන්ත්‍රණ සහ කෙටි වීඩියෝ වැඩසටහන් භාවිතයට ගන්නා ලදී. එමෙන්ම දැනුවත් කිරිමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ ද නිලධාරින් දැනුවත් කරන ලදී.

පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරිම් සඳහා ප්‍රධාන වශයෙන් ජන මාධ්‍ය භාවිතා කරයි. (කොමිෂන් සභාව සිදු කරන ලද නිරීක්ෂණවලින් අනාවරණය වූ කරුණක් වන්නේ භාෂා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව තුළ පවතින දැනුවත්භාවය තවදුරටත් වර්ධනය කළ යුතු බවයි.)

**මෙම වර්ෂය තුළ දී කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරිම් වැඩසටහන් පහත වගුවෙහි දැක්වේ.**

| අනු/ අංකය | ආයතනයේ නම | දිනය |
|---|---|---|
| 01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කළුතර | 2022/01/25 |
| 02 | රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය දියත් කිරිම | 2022/0112 |
| 03 | ජාත්‍යන්තර මව් භාෂා දිනය වෙනුවෙන් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව | 2022/02/21 |
| 04 | සිංහල භාෂා දිනය වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පළ කිරිම | 2022/03/02 |
| 05 | නේත්‍රා රූපවාහිනිය ඔස්සේ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව | 2022/06/27 |
| 06 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සුභාරති වැඩසටහන ඔස්සේ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව | 2022/07/01 |
| 07 | බස්නාහිර පළාතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් දැනුවත් කිරිම | 2022/07/18 |
| 08 | මහරගම තරුණසේවා සභාවේ පවත්වන ලද දැනුවත් කිරිමේ වැඩසටහන | 2022/09/01 |
| 09 | ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 2022/10/25 |
| 10 | මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තෝරාගත් නිලධාරීන් දැනුවත් කිරිම. | 2022/11/30 |




කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කිරීම.





ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කිරීමේ මාර්ගගත වැඩසටහන






ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සුභාරතී වැඩසටහන

- **පාසල් භාෂා කව**

රාජ්‍ය සේවයෙහි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමට පවතින ප්‍රධාන ගැටළුව වන්නේ දෙවන භාෂා ප්‍රවීණතාව සහිත නිලධාරින්ගේ හිගතාවයයි. මෙයට හේතුව වන්නේ වර්තමාන රාජ්‍ය සේවයෙහි නිලධාරින් මවු භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව පමණක් පාසල් අධ්‍යාපනය තුළින් හදාරා තිබීමයි.

වර්තමානයේ දී පාසල් අධ්‍යපනය මඟින් මවු භාෂාව, දෙවන භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට අවස්ථාව සලසා ඇත. දෙවන භාෂා ඉගැන්වීම 09 වන ශ්‍රේණිය දක්වා පමණක් වුවත් මෙම ක්‍රමවේදය තුළ භාෂා තුන පිළිබඳ සැළකිය යුතු ප්‍රවීණතාවක් ලබාගැනීමට පාසල් ළමුන්ට අවකාශ සැලසී ඇත.

පාසල් අධ්‍යාපනයේ පවතින මෙම නව ප්‍රවණතාව සැලකිල්ලට ගෙන අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කර පාසැල් තුළ පාසැල් භාෂා කව පිහිටුවීම සම්බන්ධයෙන් නව වැඩසටහනක් ආරම්භ කිරිමට කොමිෂන් සභාව කටයුතු කරන ලදී. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් භාෂා කව පිහිටුවීම මැයෙන් චක්‍ර ලේඛයක් 2015/08/14 දිනැතිව නිකුත් කරන ලදී. පාසල් භාෂා කව පිහිටුවීමේ අරමුණු වන්නේ,

I. ද්වි භාෂාවෙන් හෘදයාංගමව බැඳුණු එකම ලාංකේය ජාතියක් බිහි කිරිමේ අරමුණ සිසු පරපුර වෙත ළඟා කිරිම.
II. පාසල් ළමුන් තුළ ත්‍රෛභාෂා භාවිත කිරිම සම්බන්ධයෙන් ආකල්ප හා උනන්දුව ඇති කිරිම.
III. පාසල් තුළදී ඇසෙන, දකින, කියන සෑම දෙයක්ම ත්‍රිෂාවෙන් සිදු කිරිම.
IV. මව් භාෂාව, දෙවන ජාතික භාෂාවක් වශයෙන් සිංහල හෝ දෙමළ භාෂාවන් සහ සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව යන භාෂා තුනම ප්‍රායෝගික ලෙස භාවිතයට ගැනීම උනන්දු කරවීම.
V. පන්ති කාමරයේ න්‍යායිකව ඉගෙනුම ලබන භාෂා ප්‍රායෝගික ලෙස භාවිතා කිරිමේ කුසලතාව ලබාගැනීම.
VI. සියලුම බාහිර කටයුතුවලදී ප්‍රායෝගික වශයෙන් ත්‍රිභාෂාව භාවිතා කරමින් වැඩසටහන් මෙහෙයවීම. උදා : ක්‍රීඩා කටයුතු, රැස්වීම්වලදී

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දියත් කළ යුතු ක්‍රියාකරකම්ද මෙම චක්‍ර ලේඛයේ ඇතුළත් වේ. ඉහත චක්‍ර ලේඛය ප්‍රකාරව පාසැල් තුළ පාසල් භාෂා කව ප්‍රවර්ධනය කිරිම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**මෙම වර්ෂයේ දී එවැනි වැඩසටහන් දෙකක් කොමිෂන් සභාව මගින් සිදු කරන ලදී. ඒවා නම්,**

I. රාජ්‍ය භාෂා සතියට සමගාමීව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් පවත්වන ලද කෙටි කතා තරගයෙහි ත්‍යාග ප්‍රධානෝත්සවය බත්තරමුල්ල වෝටර්ස් ඒඩ්ජ් හෝටලයෙහි පැවැත්වීම - 2022/08/24

II. දෙමළ භාෂා දිනයට සමගාමීව දෙමළ සංස්කෘතික අංගයන්ද ඇතුළත්ව පාසල් භාෂා කව පිළිබඳව දැනුවත් කිරිමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වීම. – 2022/10/28



*රචනා තරඟයේ සහතිකපත් ප්‍රදානය*




*දෙමළ භාෂා දිනය*

## 4. උපදේශනය

❖ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමට අදාළ ත්‍රෛභාෂා මාර්ගෝපදේශ සංග්‍රහය

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නියාමනය කිරිම සඳහා කොමිෂන් සභාව විසින් හඳුනාගත් නිර්ණායක 10 ක් ඇත. මෙම නිර්ණායක ඇතුළත් කර මාර්ගෝපදේශ සංග්‍රහයක් කොමිෂන් සභාව මගින් නිර්මාණය කරන ලදී. සියලුම රාජ්‍ය ආයතනවලට මෙම මාර්ගෝපදේශ සංග්‍රහය අත්පොතක් ලෙස භාවිත කළ හැකිය. කොමිෂන් සභාව සිදු කරනු ලබන දැනුවත් කිරිමේ වැඩසටහන්වලදී සහ විගණනවලදී එක් එක් ආයතනය වෙත මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටපතක් ලබාදීමට අපේක්ෂා කෙරේ.




*මාර්ගෝපදේශ සංග්‍රහය*

## ක්‍රියාත්මක කරන ලද නව වැඩසටහන්

### I. මාර්ගගත ක්‍රමයට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මඟින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. නමුත් රටෙහි පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ ඉන්ධන අර්බුදය හේතුකොටගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගොස් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයක් නොමැති විය. එබැවින් දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මාර්ගගත ක්‍රමයට දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

### II. මාර්ගගත ක්‍රමය මඟින් සමීක්ෂණ පැවැත්වීම.

පසුගිය කාලසීමාව තුළදී රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මඟින් භෞතිකව සිදු කරන ලද භාෂා විගණන ඉලක්කගත ප්‍රමාණයට සිදු කිරීමට නොහැකි විය. මේ නිසා ගූගල් ආකෘතියක් (Google Form) නිර්මාණය කර මාර්ගගත ක්‍රමයට වැඩි ආයතන සංඛ්‍යාවක තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කරන ලදී.

## 2022 වර්ෂයෙහි ක්‍රියාකාරකම් දියත් කිරීමේ දී පැවැති අභියෝග

### I. මානව සම්පත් හිඟය



රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 42 කි. එහෙත් මෙම වර්ෂයේ දී කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 24ක් පමණක් සිටි අතර තනතුරු 18ක් පුරප්පාඩු වී පැවතුණි. රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ අරමුණු ඉටු කරගැනීමට සෘජුව සම්බන්ධවන භාෂා නිලධාරි තනතුරු 03න් 02ක් පුරප්පාඩුව පැවති අතර භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරි තනතුරු 10න් 06 ක් පුරප්පාඩුව පැවතුණි. තව ද භාෂා පරිවර්තන තනතුරු 03ම පුරප්පාඩුව පැවතුණි.

### II. ඉන්ධන හිඟය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන භාෂා විගණන, දැනුවත් කිරීමේ වැඩසටහන් , පාසල් වැඩසටහන් ආදිය ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් වේ. මෙම වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ දී ප්‍රවාහන පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය කරුණක් වේ. මෙම වර්ෂය තුළදී පැවති ඉන්ධන හිඟය හේතුවෙන් අපේක්ෂිත පරිදි ක්ෂේත්‍ර වැඩසටහන් ක්‍රියාවට නැංවීමට නොහැකි විය.



**III කොටස**

# රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශන

# 2022



රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
**2022 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| වත්කම් | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| භාණ්ඩ ලේඛන | 1 | 292,855.00 | 292,900.00 |
| පෙර ගෙවීම් | 2 | 72,527.44 | 22,698.00 |
| සේවකයින්ට ලබාදෙන ණය | 3 | 3,902,170.04 | 4,018,826.94 |
| ඉන්වෙන්ට්‍රි අයිතම | | - | 103,500.00 |
| ලිපි ද්‍රව්‍ය (තොග) | | 1,294,648.70 | 474,019.74 |
| උප අග්‍රිම පියවීම | | 3.00 | - |
| මුදල් සහ මුදල් සමාන | | 1,275,267.12 | 5,877,971.80 |
| විශේෂ අත්තිකාරම් | | - | 2,000.00 |
| අයවිය යුතු ආපදා ණය පොලී | 15 | 2,203.60 | - |
| උත්සව අත්තිකාරම් | | 8,754.00 | 7,400.00 |
| අනිකුත් වත්කම් | | - | 14,950.00 |
| | | **6,848,428.90** | **10,814,266.48** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 4 | 12,923,363.47 | 7,987,641.77 |
| අස්පෘශ්‍ය වත්කම් | 4.1 | 553,320.00 | - |
| | | **13,476,683.47** | **7,987,641.77** |
| මුළු වත්කම් | | **20,325,112.37** | **18,801,908.25** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු | 5 | 4,233,849.73 | 4,145,642.32 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 172,414.00 | 136,014.00 |
| | | **4,406,263.73** | **4,281,656.32** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 6 | **4,395,671.17** | **3,952,612.77** |
| **මුළු බැරකම්** | | **8,801,934.90** | **8,234,269.09** |
| **ශුද්ධ වත්කම්** | | **11,523,177.48** | **10,567,639.16** |
| **ශුද්ධ වත්කම්/සම කොටස්** | | | |
| **සමුච්චිත අතිරික්තය/හිඟය** | 7 | **11,523,177.48** | **10,567,639.16** |

**මෙයට අමුණා ඇති සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.**

**මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති සහ රජයේ මූල්‍ය රෙගුලාසි චක්‍රලේඛවලට අනුකූලව පිළියෙල කොට ඇත.**

**මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව වගකියනු ලැබේ. කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.**

| | | |
|---|---|---|
| ......................... | .............................. | .............................. |
| **(සභාපති)** | **(කොමිෂන් සභා සාමාජික)** | **ආර්.යූ. හෙට්ටිතන්ත්‍රිගේ** |
| | | **(ගණකාධිකාරි - වැඩබලන)** |

| | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| **ආදයම්** | | | |
| භාණ්ඩාගාරයෙන්ලැබුනු පුනරාවර්තන ප්‍රදානයන් | | 28,309,000.00 | 28,122,000.00 |
| ආදායම | | 33,302.85 | 1,100.00 |
| වෙනත් ආදායම් | 8 | 164,861.25 | 167,615.61 |
| **මුළු ආදායම්** | | **28,507,164.10** | **28,290,715.61** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතනසහ සේවක ප්‍රතිලාභ | 9 | 16,800,105.14 | 16,000,549.20 |
| සැපයුම් සහපරිභෝජ්‍ය පාවිච්චි කිරීම් | 10 | 1,912,834.88 | 1,949,732.52 |
| ක්ෂය කිරීම් | | 3,555,232.63 | 1,470,158.63 |
| අළුත්වැඩියා සහ නඩත්තු කිරීම් | 11 | 3,262,062.97 | 1,113,061.47 |
| උපයෝග සහ අනිකුත්සේවාවන් | 12 | 9,721,632.71 | 5,231,318.44 |
| අනිකුත් වියදම් | 13 | 546,315.94 | 593,940.39 |
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් | 14 | 2,007,341.51 | 1,129,431.10 |
| විගණන ගාස්තු | | 250,000.00 | 250,000.00 |
| **මුළු වියදම්** | | **38055525.78** | **27,738,191.75** |
| **කාලපරිච්ඡේදය සඳහාඅතිරික්තය/(හිඟය)** | | **(9,548,361.68)** | **552,523.86** |

මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

## 2022 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස්වීමේ ප්‍රකාශනය

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව**

**2022 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් /හිමිකම්වල වෙනස්වීමේ ප්‍රකාශනය**

| | භාණ්ඩාගාරයෙන් ලැබුණ ප්‍රතිපාදන | සමුච්චිත අරමුදල | වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | වෙනත් | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | - | 7,704,496.05 | - | - | - | 7,704,496.05 |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රග්ධන ප්‍රදානයන් | 1,745,000.00 | - | - | - | - | 1,745,000.00 |
| ප්‍රත්‍යාගණනය කිරීම | - | - | - | - | 744,650.00 | 744,650.00 |
| 2021 වර්ෂය සඳහා අතිරික්තය / හිඟය | - | - | 552,523.86 | - | - | 552,523.86 |
| නොපියවන ලද උප අග්‍රිම නිවැරදි කිරීම | - | - | - | (179,030.75) | - | (179,030.75) |
| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,745,000.00** | **7,704,496.05** | **552,523.86** | **(179,030.75)** | **744,650.00** | **10,567,639.16** |
| | | | | | | |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | - | 10,567,639.16 | - | - | - | 10,567,639.16 |
| උපසව අත්තකාරම ණයෙහි ආරම්භක ශේෂයට ගැලපීම | - | 2,600.00 | - | - | - | 2,600.00 |
| ඉදිරිපිටිය වත්කමෙහි (වෙන අඩුවය) ආරම්භක ශේෂයට ගැලපීම | - | 614,800.00 | - | - | - | 614,800.00 |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානයන් | 2,300,000.00 | - | - | - | - | 2,300,000.00 |
| ප්‍රත්‍යාගණනය කිරීම | - | - | - | - | 7,856,500.00 | 7,856,500.00 |
| 2022 වර්ෂය සඳහා අතිරික්තය / හිඟය | - | - | (9,548,361.68) | - | - | (9,548,361.68) |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | **2,300,000.00** | **11,185,039.16** | **(9,548,361.68)** | | **7,856,500.00** | **11,523,177.48** |

**මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.**

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව**
**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ගැලීම් ප්‍රකාශය**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම** | | |
| අතිරික්තය/(හිඟය) | 9,548,361.68) | 552,523.86 |
| **ජංගම නොවන සංචලන** | | |
| **වාහන අපහරණය කිරීමෙන් ලද ලාභය** | - | - |
| **පාරිතෝෂික** | 443,058.40 | 390,252.50 |
| **ක්ෂය කිරීම්** | 3,555,232.63 | 1,470,158.63 |
| **පෙර වර්ෂයේ ගැලපීම්** | | |
| **උත්සව ණය ශේෂය ගැලපීම** | 2,600.00 | - |
| ජංගම නොවන සංචලනවලට පසුව මුදල් ගැලීම | (5,547,470.65) | 2,412,934.99 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| පෙර ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම | (49,829.44) | (22,698.00) |
| භාණ්ඩ ලේඛනවල (වැඩිවීම)/අඩුවීම | 45.00 | - |
| සේවකයින්ට ලබාදුන ලද ණයවල (වැඩිවීම)/අඩුවීම | 116,656.90 | (668,356.46) |
| ඉන්වෙන්ට්‍රි අයිතමවල (වැඩිවීම)/අඩුවීම | 103,500.00 | (103,500.00) |
| ලිපිද්‍රව්‍යවල (තොග) (වැඩිවීම)/අඩුවීම | (820,628.96) | 344,071.16 |
| අනිකුත් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම | 14,950.00 | (14,950.00) |
| උපඅග්‍රිමවල (වැඩිවීම)/අඩුවීම | (3.00) | - |
| විශේෂ අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම | 2,000.00 | - |
| නොපියවන ලද අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම | - | - |
| අයවිය යුතු ආපදා ණය පොලීවල (වැඩිවීම)/අඩුවීම | (2,203.60) | - |
| උත්සව අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම | (1,354.00) | - |
| ගෙවිය යුතු - (වැඩිවීම)/අඩුවීම | 88,207.41 | 3,840,080.48 |
| උපඅග්‍රිම පියවීම්වලවැඩිවීම/(අඩුවීම) | - | 14,500.00 |
| ගෙවිය යුතු විගණනගාස්තුවල (වැඩිවීම)/අඩුවීම | 36,400.00 | (177,200.00) |
| | (512,259.69) | 3,211,947.18 |
| **මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම** | **(6,059,730.34)** | **5,624,882.17** |
| **ආයෝජනක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම** | | |
| දේපළ යන්ත්‍ර සහ පිරියතම්ළදී ගැනීම් | (842,974.34) | (3,297,348.39) |
| මෝටර් රථ අපහරණයකිරීම | - | - |
| ආයෝජනක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම | **(842,974.34)** | **(3,297,348.39)** |
| **මූල්‍යක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම** | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධනප්‍රදානයන් | 2,300,000.00 | 1,745,000.00 |
| මූල්‍යක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම | **2,300,000.00** | **1,745,000.00** |
| **මුදල් සහ සමානඅගයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **(4,602,704.68)** | **4,072,533.78** |
| වර්ෂය ආරම්භයේදීමුදල් සහ සමාන අගයන් | **5,877,971.80** | **1,805,438.02** |
| වර්ෂය අවසානයේදීමුදල් සහ සමාන අගයන් | **1,275,267.12** | **5,877,971.80** |

## 1. වාර්තා කරන ආයතනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් සංස්ථාපනය කරන ලද පූර්ණ ලෙස රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනයක් වන අතර, එය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ විෂයපථයට අයත් වේ. කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය "ජනජය සිටි" ගොඩනැගිල්ල, 09 වෙනි මහල, නාවල පාර, රාජගිරිය අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.1 ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමයි.

### 1.2 සේවක සංඛ්‍යාව

2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව 21 ක්වූ අතර, 2022 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 42 කි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂක මණ්ඩලය වගකියනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශනය, මුදල් ගැලීමේ ප්‍රකාශනය, සමකොටස්වල (Equity)වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යන කරුණුවලින් සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය, මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ විගණකාධිපති දෙපාර්මේන්තුව එක්ව නියම කොට ඇති පරිදි සහ මුදල් රගුලාසි සහ අදාළ රජයේ චක්‍රලේඛවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කොට ඇත.

### 2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන; 1983 අංක 12 දරන පාරිතෝෂික පනත පාදක කරගත් සේවක විශ්‍රාම පාරිතෝෂික හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා ගැලපීම් කොට නැත.

### 2.3 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

ඇස්තමේන්තුවල සැලකිය යුතු ප්‍රමාණයක තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනෙන ගණන් මත අවිනිශ්චිත ලෙස වඩාත් සැලකිය යුතු බලපෑම් වන්නේ පහත කරුණු ය.

සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (සටහන 6)
වත්කම් අපහායනය කිරීම (සටහන 4 සහ 4.1)

## 2.4 ද්‍රව්‍යාත්මක බව සහ ඒකරාශි කිරීම

එක් එක් වර්ගවලට අයත් සමරූපී අයිතමයන් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අසමරූපී වර්ගවල හෝ කාර්යයන්හි අයිතමයන් අද්‍රව්‍ය මිසක වෙන්කර ගෙනහැර දක්වා ඇත.

## 2.5 සංසන්දනාත්මක තොරතුරු

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීමට සෑම අවස්ථාවකදීම අනුකූලතාවයක් දක්වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වර්ගීකරණය ඇත.

## 3 සුවිශේෂී ගිණුම් පිළිවෙත්

පසුගිය වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් පිළවෙත් වෙනස් නොවන අතර, ඒවා ස්ථිරවම ආයතනය විසින් අදාළ කරගෙන ඇත.

## 3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම
**දේපළ, පිරියත සහ උපකරණ**

**හඳුනාගැනීම සහ මිනුම් කිරීම**

දේපළ, පිරියත සහ උපකරණ ඒවා ගනු ලැබූ මිළ හෝ ඒ මත වූ යම් වෙනත් ආනුෂංගික වියදම් මත සටහන් කොට ඇත. මෙම වත්කම් පහතින් දක්වා ඇති පදනම මත සපයනු ලබන අඩු සමුච්චිත ක්ෂයවීමේ වියදමෙහි දක්වනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය, වත්කම් ලබාගැනීමට සෘජුවම අයකළ හැකි වියදමට ඇතුළත් කොට ඇත. මහා භාණ්ඩාගාරයෙන් හෝ වෙනත් රාජ්‍ය අයතනයකින් වත්කම් මාරු කරනු ලබන අවස්ථාවේදී එම වත්කම් ලබාගැනීමට එකී ආයතනයට වැය වූ වියදම හෝ ප්‍රත්‍යාගණනය කරනු ලබන මුදල මත එම වත්කම් පාවිච්චි කරන්නේ නම් එවිට එය වත්කම් පිරිවැය ලෙස සටහන් කරනු ලැබේ.

සම්පූර්ණයෙන් ක්ෂයවී සහ භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වත්කම් එහෙත් ඒවා කොමිෂන් සභාව විසින් භාවිතා කරමින් තිබෙන්නේ නම් ඒවායේ උපයෝගී ආයු කාලය තක්සේරු කළ නොහැකි බැවින් ඒවා ප්‍රත්‍යාගණනය කිරීම හෝ අපවය (impair) කිරීම සිදුකරයි. කෙසේ වෙතත් මෙවැනි ආකාරයේ වත්කම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහනෙහි අනාවරණය කරනු ඇත.

## 3.2 ඇස්තමේන්තු භාවිතය සහ තීරණ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු සෑදීම, තීරණ ගැනීම සහ උපකල්පනය කිරීම, ගිණුම් පිළිවෙත් අදාළ කරගැනීමේදී ඇතිවන බලපෑම, වාර්තාගත වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ආදිය පිළිබඳව කළමණාකරනය විසින් සැලකිල්ලට ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම්, තත්ත්ව යටතේ එකඟ විය හැකි යැයි විශ්වාස කෙරෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත මුදලින් වෙනස් විය හැකි ය.

**ක්ෂය කිරීම**

සම්පූර්ණ වර්ෂයේ ක්ෂය කිරීම සපයනු ලබන්නේ එකී අයිතම මිළදී ගනු ලැබූ වර්ෂයේ වන අතර, 2008 වර්ෂයට පෙර මිළදී ගනු ලැබූ අයිතම සඳහා වර්ෂය තුළ කරනු ලැබූ අපහරණය කිරීම්වලට ක්ෂය කිරීම් සපයා නැත. ක්ෂය කිරීම් ගණනය කරනු ලබන්නේ 2008 වර්ෂයෙන් පසුව මිළදී ගනු ලැබූ වත්කම් සඳහා අයිතමය මිළදී ගනු ලැබූ දිනය / අයිතමය අපහරණය කරනු ලැබූ මාසය මත ය.

මේ වර්ෂයට සහ සංසන්දනාත්මක වර්ෂය සඳහා සඵල ආයු කාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | අවුරුදු 5 යි |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 10 යි |
| කාර්යාලීය ගෘහභාණ්ඩ | අවුරුදු 10 යි |
| මෝටර් රථ | අවුරුදු 4 යි |
| පරිගණක | අවුරුදු 4 යි |
| වායුසමීකරණ යන්ත්‍ර | අවුරුදු 5 යි |

| | |
|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | අවුරුදු 10 යි |
| ගොඩනැගිලි - සේදුම් කාමරය | අවුරුදු 20 යි |
| අස්පෘශ්‍ය වත්කම් - වෙබ් අඩවිය | අවුරුදු 10 යි |

### 3.3 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛන දක්වනු ලබන්නේ පහල පිරිවැයකින් සහ ශුද්ධ උපලබ්ධි අගයන්වලිනි. ශුද්ධ උපලබ්ධි අගය යනු පවාරණ සහ විකුණුම් වියදම්වල ඇස්තමේන්තුගත පිරිවැයෙන් ඇස්තමේන්තුගත විකුණුම් මිළ අඩුකළ පසු ලැබෙන අගයයි. භාණ්ඩ ලේඛනය, කොමිෂන් සභාවේ ප්‍රකාශනවලින් සමන්විත වේ. මෙම ප්‍රකාශනවල උපලබ්ධි අගය යනු මිළ ස්ථාවර වනවිට විකුණුම් මිළ ය. මේ සම්බන්ධයෙන් දැරීමට විකුණුම් පිරිවැය අනුමත කරනු නොලැබේ.

### 3.4 පෙර ගෙවීම් සහ කළ යුතු ගෙවීම්

පෙර ගෙවීම් සහ කළ යුතු ගෙවීම්, දරණු ලබන තථ්‍ය පිරිවැයෙහි සහ කොන්ත්‍රාත්තුව යටතේ දැරිය යුතු පිරිවැයෙහි දක්වා ඇත.

### 3.5 සේවකයින්ට ලබාදෙන ණය

සේවකයින්ට ලබාදන ණය පිළිබඳ සඳහන් කරනු ලබන්නේ පිරිවැයෙහි ය. අනුමැතිය ලබාදී නොමැති නිසා නුසුදුසු හෝ ආපසු ලබාගත නොහැකි ණය වෙනුවෙන් ප්‍රතිපාදන සාදා නොමැත. නුසුසුදු හෝ ආපසු ලබාගත නොහැකි ණය පිළිබඳ විස්තර අනාවරණය කිරීම ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් කොට ඇත.

### 3.6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව ය. දැනට සිටින ස්ථිර සේවකයින් සඳහා වර්ෂයට අදාළ පාරිතෝෂික ලෙස තමාට හිමි අවසන් මාසයේ මූලික වැටුපෙන් අඩක් වන සේ ගණනය කොට ලබාදෙනු ඇත.

### 3.7 ආදායම්

පුනරාවර්තන වියදම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කරනු ලබන අක්මුදල් අග්‍රිමය ආදායමක් ලෙස හඳුනාගැනේ. ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් අග්‍රිමය හෝ ප්‍රාග්ධන වියදම්හි ඍජු මාරුකිරීම් හෝ ප්‍රාග්ධන වත්කම්හි ඍජු මාරුකිරීම් කොමිෂන් සභාවේ සමුච්චිත ඍජු ප්‍රාග්ධනායනය ලෙස හඳුනාගැනේ.

### 3.8 වියදම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගනු ලබන්නේ දැරීමට සිදුවන පිරිවැයෙහි ඍජු සම්බන්ධය සහ ආදායමෙහි විශේෂිත වූ අයිතමයෙහි ඉපයීම් පදනම් කරගෙන ය. කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වෙනුවන් දරනු ලබන සියළුම වියදම් එනම් දේපළ යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන වියදම් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යන වියදම් ආදී සියළුම වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කොට ඇත.

### 3.9 මුදල් ගැලීමේ ප්‍රකාශනය

මුදල් ගැලීමේ ප්‍රකාශනය පිළියෙල කොට ඇත්තේ ඍජු නොවන ක්‍රමය භාවිතා කරමිනි.

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**1. භාණ්ඩ ලේඛණ**

ප්‍රකාශන

| ප්‍රකාශනයෙහි නම | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| ඉංග්‍රීසි සිංහල පදමාලා | 53,050.00 | 53,050.00 |
| දෙමළ ඉංග්‍රීසි පදමාලා | 24,390.00 | 24,390.00 |
| දෙමළ විශේෂ පදමාලා | 135.00 | 180.00 |
| පැය 40 කෙටිකාලීන පාඨමාලා පොත | 215,280.00 | 215,280.00 |
| **එකතුව** | **292,855.00** | **292,900.00** |

**2. පෙර ගෙවීම්**

| | 2020 | 2019 |
|---|---|---|
| **288 -** තැපැල් ගාස්තු | 12,075.00 | - |
| **2862 -** කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම | 32,277.44 | 22,698.00 |
| **2864 -** පරිගණක නඩත්තු කිරීම | 28,175.00 | - |
| | 72,527.44 | - |

**3. සේවකයින්ට ලබාදෙන ණය සහ අත්තිකාරම්**

| වර්ගය | 2022.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | ප්‍රාග්ධන අයකරගැනීම් | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| උත්සව අත්තිකාරම් | 7,400 | 142,600.00 | 141,246.00 | 8,754.00 |
| ආපදා ණය | 4,018,826.94 | 480,005.85 | 596,662.75 | 3,902,170.04 |
| විශේෂ අත්තිකාරම් | 2,000.00 | 20,000.00 | 22,000.00 | - |
| | **4,028,226.94** | **642,605.85** | **759,908.75** | **3,910,924.04** |

**4. දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ**

පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම

| වර්ගය | 2022.01.01 දිනට ශේෂය | එකතු කිරීම් / ප්‍රත්‍යාගණනය කිරීම් | අපහරණය කිරීම් | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 2,428,510.89 | 567,785.36 | - | 2,996,296.25 |
| සේදුම් කාමරය | 868,837.50 | 124,758.50 | - | 993,596.00 |
| පරිගණක | 2,598,750.00 | - | 98,150.00 | 2,500,600.00 |
| මෝටර් රථ | 6,365,000.00 | 7,500,000.00 | 6,365,000.00 | 7,500,000.00 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 108,500.00 | - | - | 108,500.00 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | 6,214,106.80 | 94,950.00 | 75,052.75 | 6,234,004.05 |
| කාර්යාලීය උපකරණ | 761,725.00 | 141,980.48 | 21,050.00 | 882,655.48 |
| **මුළු පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම** | **19,345,430.19** | **8,429,474.34** | **6,559,252.75** | **21,215,651.78** |

සමුච්චිත ක්ෂය කිරීම්

| | | | | |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 101,187.95 | 257,045.72 | - | 358,233.68 |
| සේදූම් කාමරය | - | 4,139.98 | - | 4,139.98 |
| පරිගණක | 1,588,882.92 | 625,150.00 | 98,150.00 | 2,115,882.92 |
| මෝටර් රථ | 6,365,000.00 | 1,875,000.00 | 6,365,000.00 | 1,875,000.00 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 21,700.00 | 21,700.00 | - | 43,400.00 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | 3,125,764.63 | 623,400.41 | 75,052.75 | 3,674,112.29 |
| කාර්යාලීය උපකරණ | 155,252.92 | 87,316.52 | 21,050.00 | 221,519.44 |
| **මුළු සමුච්චිත ක්ෂය කිරීම්** | **11,357,788.42** | **3,493,752.63** | **6,559,252.75** | **8,292,288.31** |
| | | | | |
| ශුද්ධ පොත් අගය | **7,987,641.77** | | | **12,923,363.47** |

**4.1** අස්පෘශ්‍ය වත්කම්

| | | | | |
|---|---|---|---|---|
| වෙබ් අඩවිය | 614,800.00 | - | - | **614,800.00** |
| | 614,800.00 | - | - | **614,800.00** |

**සමුච්චිත ක්ෂය කිරීම**

| | | | |
|---|---|---|---|
| **වෙබ් අඩවිය** | - | **614,800.00** | 61,480.00 |
| **ශුද්ධ පොත් අගය** | **614,800.00** | | **55,320.00** |

**අනාවරණය කිරීම්**

1. රු. 6,365,000.00 ක වටිනාකමකින් යුත් මෝටර් රථ, රු. 8,850.00 ක වටිනාකමකින් යුත් කාර්යාලීය උපකරණ සහ රු. 70,000.00 ක වටිනාකමකින් යුත් කාර්යාලීය ගෘහභාණ්ඩ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති අතර එම වත්කම් ආනුෂංගික ලෙස රු. 7,500,000.00, රු, 6,500.00 සහ රු. 80,000.00 කට ප්‍රත්‍යාගණනය කර ඇත.

2. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේදී වත්කම් කේතන පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර එමගින් සම්පූර්ණයෙන්ම ක්ෂය කරනු ලැබූ වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කරන ලදි.

3. මෙම ගොඩනැගිල්ල කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාවට අයත් එකකි. එබැවින් සේදුම් කාමරය ඉදිකිරීමට දරණ ලද වියදම් වත්කමේ ශුද්ධ අගය පදනම් කරගෙන බදු කාලය අවසානයේදී ආපසු ලබාදීමට ඔවුන් එකඟවී ඇත.

4. මෙම කාර්යාල පරිශ්‍රය රාජ්‍ය භාෂා කාමිෂන් සභාව විසින් දීර්ඝකාලීන බදු පදනම මත භාවිතා කිරීමට අපේක්ෂා කරන බැවින් අභ්‍යන්තර කාර්යාල බෙදීම් සහ සේදුම් කාමරයේ ඵලදායි ආයු කාලය ආනුෂංගික ලෙස පිළිවෙලින් අවුරුදු 10 කට සහ 20 කට ඇස්තමේන්තු කර ඇත.

## 5. ගෙවිය යුතු

| | | | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|---|
| 2841 | - | ලිපිද්‍රව්‍ය | 7,300.00 | 24,728.30 |
| 2811 | - | වැටුප් | - | 17,073.55 |
| 2844 | - | පුවත්පත් | 3,870.00 | - |
| 2866 | - | මෝටර් රථ අලුත්වැඩියා කිරීම් | 17,680.00 | - |
| 2883 | - | දුරකථන බිල්පත් | 33,018.06 | 21,524.21 |
| 2886 | - | පවිත්‍රතා සේවා | - | 90,524.21 |
| 2887 | - | ආරක්ෂක සේවා | - | 100,440.00 |
| 2464 | - | පරිගණක නඩත්තුකිරීම් | - | - |
| 2861 | - | ගොඩනැගිලි නඩත්තුකිරීම් | 1,799,639.22 | 236,237.07 |
| 2849 | - | වෙනත් | - | - |
| 2815 | - | අතිකාල ගෙවීම් | 11,234.73 | 22,604.45 |
| 2816 | - | නිවාඩු වෙනුවට ගෙවීම් | 2,144.50 | - |
| 2540 | - | ගෙවිය යුතු තැන්පතු | 250,463.22 | 85,373.16 |
| 2831 | - | ගමන් වියදම් | - | 1,050.00 |
| 3302 | - | බඳවා ගැනීම් හා විභාග | - | 347,383.39 |
| 2882 | | කුළී | 1,821,000.00 | 1,821,000.00 |
| 2201 | | ගොඩනැගිලි | - | 1,291,798.13 |
| 3042 | | පොත් මුද්‍රණය කිරීම් | 287,500.00 | - |
| 3305 | | අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | - | 86,400.00 |
| | | | **4,233,849.73** | **4,145,642.32** |

**6. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| ඉදිරියට ගෙනා ශේෂය | 3,952,612.77 | 3,562,360.27 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 443,058.40 | 390,252.50 |
| වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම් | - | - |
| | **3,395,671.17** | **3,952,612.77** |

**7. සමුච්චිත අරමුදල**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| පෙර වර්ෂයේ ගැලපීම්වලට පෙර ඉදිරියට ගෙනා ශේෂය (+) | 10,567,639.16 | 7,704,496.05 |
| ප්‍රාග්ධනවියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් | 2,300,000.00 | 1,745,000.00 |
| අතිරික්තයට/(ඌණතාවයට) පෙර සමුච්චිත අරමුදල | 12,867,639.16 | 9,449,496.05 |
| වර්ෂය සඳහා අතිරික්තය/(ඌණතාවය) | (9,548,361.68) | 552,523.86 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම | 7,500,000.00 | - |
| පරිගණක ප්‍රත්‍යාගණනය කිරීම | - | 454,900.00 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම | 80,000.00 | 181,250.00 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම | 6,500.00 | - |
| පිරියත හා යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කිරීම | - | 108,500.00 |
| උත්සව ණය ශේෂයේ ආරම්භක ශේෂයට ගැලපීම | 2,600.00 | - |
| අස්පෘශ්‍ය වත්කම්වල (වෙබ් අඩවිය) ශේෂයේ ආරම්භක ශේෂයට ගැලපීම | 614,800.00 | - |
| නොපියවන ලද උප අග්‍රිම නිවැරදි කිරීම | - | (179,030.75) |
| | **11,523,177.48** | **10,567,639.16** |

**8. අනිකුත් ආදායම්**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| සේවක ආපදා ණය - පොලී | 158,695.65 | 167,615.61 |
| විශේෂ අත්තිකාරම් - පොලී | 6,165.60 | - |
| | **164,861.25** | **167,615.61** |

**9. වැටුප්, වේතන සහ සේවකයින් සඳහා ප්‍රතිලාභ**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| 2811 - වැටුප් සහ වේතන | 10,803,665.15 | 10,873,878.89 |
| 2812 - සේවක අර්ථසාධක අරමුලේ දායකත්වය - 12% | 1,552,695.88 | 1,416,690.67 |
| 2813 සේවා නියුක්තයින්ගේ භාර අරමුලේ දායකත්වය - 3% | 385,820,61 | 352,568.61 |
| 2815 - අතිකාල | 251,590.85 | 835,591.53 |
| 2817 - නිවාඩු වෙනුවට ගෙවීම් | 26,742.14 | - |
| 2817 - වැටුප් දීමනා | 3,336,532.11 | 2,131,567.00 |
| පාරිතෝෂික දීමනා වියදම් | 443,058.40 | 390,252.50 |
| | **16,800,105.14** | **16,000,549.20** |

**10. සැපයුම් සහ පාවිච්චි කරන ලද පරිභෝජ්‍ය භාණ්ඩ**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| 2841 - ලිපිද්‍රව්‍ය | 269,707.39 | 611,934.57 |
| 2843 - නිල ඇඳුම් | 34,150.00 | 8,000.00 |
| 2844 - පුවත්පත් සහ වාර සඟරා | 399,356.19 | 11,960.00 |
| 2851 - ඉන්ධන සහ ලිහිසි තෙල් | 831,035.00 | 776,790.00 |
| 2842 - සැපයුම් - පරිභෝජ්‍ය | 25,400.00 | 187,126.00 |
| 2849 - වෙනත් - 2849 | 353,186.30 | 353,921.95 |
| | **1,912,834.88** | **1,949,732.52** |

## 11. අලුත්වැඩියා සහ නඩත්තු කිරීම්

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| 2862 - කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම් | 457,701.16 | 84,789.49 |
| 2864 - පරිගණක නඩත්තු කිරීම් | 571,891.19 | 79,380.00 |
| 2866 - මෝටර් රථ නඩත්තු කිරීම් | 465,984.68 | 659,392.90 |
| 2865 - වායුසමීකරණ යන්ත්‍ර නඩත්තුකිරීම් | - | 18,500.00 |
| 2861 - ගොඩනැගිලි නඩත්තු කිරීම් | 1,568,687.15 | 236,237.07 |
| 2852 - රක්ෂණ සහ බලපත් | 197,798.79 | 34,762.01 |
| | **3,262,062.97** | **1,113,061.47** |

## 12. උපයෝග සහ අනිකුත් සේවාවන්

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| 2883 - දුරකථන සහඅන්තර්ජාල | 445,979.35 | 478,995.83 |
| 2882 - ගොඩනැගිලි කුලී | 7,284,000.00 | 3,035,000.00 |
| 2887 - ආරක්ෂක සේවාවන් | 1,167,779.96 | 620,460.00 |
| 2886 - පවිත්‍රතා සේවාවන් | 768,023.40 | 1,066,862.59 |
| 2888 - තැපැල් ගාස්තු | 55,850.00 | 30,000.00 |
| | **9,721,632.71** | **5,231,318.44** |

## 13. අනිකුත් වියදම්

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| 3302 - බඳවාගැනීම් සහ විභාග | 477,086.94 | 347,383.39 |
| පරිත්‍යාග කරන ලද පොත් සඳහා වියදම | 45.00 | - |
| 2831 - ගමන් වියදම් - දේශීය | 66,684.00 | 51,557.00 |
| 2853 - වාහන කුලියට ගැනීමේ වියදම් | 2,500.00 | - |
| 2859 - අනිකුත් ප්‍රවාහන | - | 195,000.00 |
| | **546,315.94** | **593,940.39** |

## 14. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| 3050 - වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 839,675.01 | 415,515.00 |
| 3305 - අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම් | 515,248.00 | 236,350.00 |
| 3070 - වෙනත් | 22,278.50 | 132,566.10 |
| 3041 - විගණන කමිටු වියදම් | 34,250.00 | - |
| 3042 - මුද්‍රණය කිරීම් | 288,100.00 | 345,000.00 |
| 3040 - පොත් මුද්‍රණය කිරීම් | 293,040.00 | - |
| 3033 - ක්ෂේත්‍ර ගමන් බිමන් | 14,750.00 | - |
| | **2,007,341.51** | **1,129,431.10** |

## 15. ආපදා ණය සහ අයවිය යුතු පොලී

| | | |
|---|---|---|
| ආපදා ණය - අයවිය යුතු පොලී | 1,469.60 | - |
| විශේෂ අත්තකාරම් - අයවිය යුතු පොලී | 734.00 | |
| | **2,203.60** | **-** |

අවසන් ගිණුම් සඳහා උපයෝජන

**2841 - ලිපිද්‍රව්‍ය**

| | |
|---|---|
| 2022.01.01 දිනට ලිපිද්‍රව්‍ය (තොග) | 474,019.74 |
| මිළදී ගැනීම් | 1,090,336.35 |
| | 1,564,356.09 |
| 2022.12.31 දිනට ලිපිද්‍රව්‍ය (තොග) | 1,294,648.70 |
| **පරිභෝජ්‍ය භාණ්ඩවල පිරිවැය** | **269,707.39** |

ගෙවිය යුතු - සඳහා ගැලපුම් සටහන්

| වියදම | මුදලින් කරන ලද ගෙවීම් | [+] 2022 වර්ෂය සඳහා ගෙවිය යුතු | [-] 2021 වර්ෂය සඳහා ගෙවිය යුතු | [-] පෙර ගෙවීම් 2022 | [+] පෙර ගෙවීම් 2021 | 2022 වර්ෂය සඳහා වියදම |
|---|---|---|---|---|---|---|
| 2841 - ලිපිද්‍රව්‍ය | 1,107,764.65 | 7,300.00 | 24,728.30 | - | - | 1,090,336.35 |
| 2811 - වැටුප් සහ වේතන | 10,873,697.09 | - | 17,073.55 | - | - | 10,856,623.54 |
| 2883 - දුරකථන සහ අන්තර්ජාල | 434,485.50 | 33,018.06 | 21,524.21 | - | - | 445,979.35 |
| 2886 - පවිත්‍රතා සේවා | 858,053.46 | - | 90,030.06 | - | - | 768,023.40 |
| 2887 - ආරක්ෂක සේවා | 1,268,219.96 | - | 100,400.00 | - | - | 1,167,779.96 |
| 2888 - තැල් ගාස්තු | 67,925.00 | | | 12,075.00 | | 55,850.00 |
| 2849 - වෙනත් | 353,186.30 | - | - | - | - | 353,186.30 |
| 2882 - කුළී | 7,284,000.00 | - | 1,821,000.00 | - | - | 7,284,000.00 |
| 3042 - මුද්‍රණ | 288,100.00 | - | - | - | - | 288,100.00 |
| 2844 - පුවත්පත් | 395,486.19 | 3,870.00 | | - | | 399,356.19 |
| 2831 - ගමන් වියදම් | 67,734.00 | - | 1,050.00 | - | - | 66,684.00 |
| 2815 - අතිකාල | 262,960.57 | 11,234.73 | 22,604.45 | - | - | 251,590.85 |
| 2816 - නිවාඩු වෙනුවට ගෙවීම් | 24,597.64 | 2,144.50 | - | - | | 26,742.14 |
| 2852 - රක්ෂණ සහ බලපත්‍ර | 197,798.79 | - | - | - | - | 197,798.79 |
| 2862 - කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම් | 467,280.60 | - | - | 32,277.44 | 22,698.00 | 457,701.16 |
| 2861 - ගොඩනැගිලි නඩත්තු කිරීම් | 5,285.00 | 1,563,402.15 | 236,237.07 | - | - | 1,568,687.15 |
| 2864 - පරිගණක නඩත්තු කිරීම් | 600,066.19 | | | 28,175.00 | | 571,891.19 |
| 2866 - මෝටර් රථ අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් | 448,304.68 | 17,680.00 | | - | | 465,984.68 |
| 3302 - බඳවා ගැනීම් හා විභාග | 824,470.33 | - | 347,383.39 | - | - | 477,086.94 |
| 3201 - ගොඩනැගිලි | 1,984,342.00 | - | 1,291,798.13 | - | - | 692,543.57 |
| 3305 - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | 601,648.00 | - | 86,400.00 | - | - | 515,248.00 |
| 2864 - පරිසනක නඩත්තු කිරීම් | 600,066.19 | | | | | 600,066.19 |
| 3040 - පොත් මුද්‍රණය කිරීම් | 5,540.00 | 287,500.00 | - | - | - | 293,040.00 |

වැටුප් සහ වේතන

| | |
|---|---|
| ගෙවිය යුතු සහ පෙර ගෙවීම්වලින් පසුව 2022 වර්ෂය සඳහා වියදම | 10,856,623.54 |
| (-) වැටුප් අධිභාර | (52,958.40) |
| ගෙවිය යුතු සහ පෙර ගෙවීම්වලින් පසුව 2022 වර්ෂය සඳහා වියදම | 10,803,665.14 |

උපඅග්‍රිම ගිණුම

| | |
|---|---|
| ආරම්භක ශේෂය | |
| (+) රාජ්‍ය නිලධාරීන් සඳහා උපඅග්‍රිම | 1,447,225.00 |
| | 1,447,225.00 |
| (-) උපඅග්‍රිම පියවීම් | (1,447,222.00) |
| පියැවුම් ශේෂය | **3.00** |

පරිභෝජ්‍ය ගිණුම

| | |
|---|---|
| 2842 - පරිභෝජ්‍ය | 25,400.00 |
| 2840 - සැපයුම් | - |
| 2022 වර්ෂය සඳහා මුදලින් වියදම | 25,400.00 |

විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන

| | |
|---|---|
| ඉදිරිය ගෙන ආ ශේෂය | 136,014.00 |
| (+) 2022 වර්ෂය තුළ එකතු කිරීම් | 250,000.00 |
| | 386,014.00 |
| (-) 2022 වර්ෂය තුළ ගෙවන ලද විගණන ගාස්තු | 213,600.00 |
| 2022.12.31 දිනට ශේෂය | **172,414.00** |

තැන්පතු

| | |
|---|---|
| 2022.02.01 දිනට ආරම්භක ශේෂය | 85,373.16 |
| 2660 - වර්ෂය තුළ ලද ගෙවිය යුතු තැන්පතු | 177,365.06 |
| | 262,738.22 |
| (-) වර්ෂය තුළ සිදුකරන ලද තැන්පතු ගෙවීම් | (12,275.00) |
| 2022.12.31 දිනට ගෙවිය යුතු තැන්පතුවල ශේෂය | **250,463.22** |

## ක්ෂය කිරීම්

**පරිගණක**

| | පිරිවැය | 25% ක්ෂය කිරීම |
|---|---|---|
| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | 2,598,750.00 | |
| 2018 වර්ෂයට පෙර මිළදී ගත් පරිගණකවල සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම ක්ෂය කළහැකි පිරිවැයේ ශේෂය | (98,150.00) | 625,150.00 |
| **එකතුව** | **2,500,600.00** | **625,150.00** |

රු. 98,150.00 ක වටිනාකමින් යුත් පරිගණක සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති අතර ඒවා රු. 2,300 කට අපහරණය කර ඇත.

මෝටර් රථ

| | 25% | පිරිවැය | 25% ක් ක්ෂය කිරීම |
|---|---|---|---|
| 2022.01.01 දිජට ආරම්භක ශේෂය | | 6,365,000.00 | |
| සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද අගය | | (6,365,000.00) | |
| ක්ෂය කළ හැකි පිරිවැයේ ශේෂය | | - | |
| <u>ප්‍රත්‍යාගණනය කිරීම්</u> | | | |
| අංක NB-3467 දරණ වෑන් රථය | | 7,500,000.00 | 1,875,000.00 |
| එකතුව | | **7,500,000.00** | **1,875,000.00** |

**මෝටර් රථයේ (NB-3467 දරණ වෑන් රථය) වටිනාකම 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද අතර එය රු. 7,500,000.00 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.**

**අංක QP CAQ 1997 දරණ මෝටර් රථය ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශ ලේකම්ගේ හිමිකාරත්වය යටතේ පවතී.**

**අංත WP TF 9679 දරණ යතුරු පැදිය ධාවන තත්තවයේ නොපවතී.**

**කාර්යාලීය ගෘහභාණ්ඩ**

| | පිරිවැය | 10% ක් ක්ෂය කිරීම |
|---|---|---|
| **2022.01.01 දිනට ආරම්භක ශේෂය** | 6,214,106.80 | |
| **සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද සහ අපහරණය කිරීම්** | (5,052.75) | |
| **සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද සහ ප්‍රත්‍යාගණනය කිරීම්** | (70,000.00) | |
| | 6,139,054.05 | 613,905.41 |
| **ජර්නල සටහන - කබාය එල්ලනය** | 14,950.00 | 1,495.00 |
| **වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රත්‍යාගණනය කිරීම්** | 80,000.00 | 8,000.00 |
| **එකතුව** | **6,234,004.05** | **623,400.41** |

**රු. 70,000.00 ක් වටිනා කාර්යාලීය ගෘහභාණ්ඩ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද අතර ඒවා රු. 80,000.00 කට ප්‍රත්‍යාගණනය කර ඇත.**

**රු. 5,052.75 ක් වටිනා කාර්යාලීය ගෘහභාණ්ඩ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද අතර ඒවා රු. 1,500.00 කට ප්‍රත්‍යාගණනය කර ඇත.**

**කාර්යාලීය උපකරණ**

| | පිරිවැය | 10% ක් ක්ෂය කිරීම |
|---|---|---|
| **2022.01.01 දිනට ආරම්භක ශේෂය** | 761,725.00 | |
| **සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද අගය** | (12,200.00) | |
| **සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රත්‍යාගණන අගය** | (8.850.00) | |
| | **740,675.00** | 74,067.50 |

**වර්ෂය තුළදී සිදුකරන ලද මිළදී ගැනීම්**

| | | |
|---|---|---|
| පංකාව-31,980.48*10%*6/12 | 31.980.48 | 1,599.02 |
| **ජර්නල් සටහන** | 103,500.00 | 10,350.00 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම | 6,500.00 | 650.00 |
| එකතුව | **882,655.48** | **86,666.52** |

පිරියත සහ යන්ත්‍රෝපකරණ

| | | |
|---|---|---|
| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | 108,500.00 | 21,700.00 |
| එකතුව | **108,500.00** | 21,700.00 |

ගොඩනැගිලි
ගොඩනැගිලි සහ ව්‍යුහයන්

| | | |
|---|---|---|
| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | 2,428,510.89 | 242,851.09 |
| 2022 වර්ෂය තුළ සිදුකරන ලද එකතු කිරීම් අභ්‍යන්තර කාර්යාලීය බෙදීම් | 567,785.36 | 14,194.63 |
| එකතුව | **2,996,296.25** | **257,045.72** |

ගොඩනැගිලි

| | | |
|---|---|---|
| 2022 වර්ෂය තුළ සිදුකරන ලද එකතු කිරීම් | 993,596.00 | 4,139.98 |
| එකතුව | **993,596.00** | **4,139.98** |

මෙම කාර්යාල පරිශ්‍රය රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් දීර්ඝකාලීනව කුලී පදනම මත භාවිතා කිරීමට අපේක්ෂා කරන බැවින් මෙම අභ්‍යන්තර කාර්යාලීය බෙදීම්වල ඵලදායි ආයු කාලය අවුරුදු 10 කට තක්සේරු කර ඇත.

අස්පෘශ්‍ය වත්කම් - වෙබ් අඩවිය

| | | |
|---|---|---|
| ජර්නල් සටහන අංක 65 | 614,800.00 | 61,480.00 |
| එකතුව | **614,800.00** | **61,480.00** |

## ආපදා ණය උපලේඛනය

| නම | | 2022.01.01 දිනට ශේෂය (රු.) | 2021 වර්ෂය තුළදී ලබාදුන් ණය මුදල (රු.) | වර්ෂය තුළදී ප්‍රාග්ධන අයකර ගැනීම් | 2021.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 1 | ජී.ඒ.ඩී.සී. ගනේපොල | 247,500.00 | 27,500.00 | 31,840.00 | 243,160.00 |
| 2 | ඩබ්ලිව්.ඩී.පී. පුෂ්පකුමාර | 186,480.37 | 50,000.00 | 30,000.00 | 206,480.37 |
| 3 | එල්.ජී.එස්. ගාමිණී | 247,500.00 | - | 30,000.00 | 217,500.00 |
| 4 | එම්.ඒ.එල්.එම්. රමීස් | 63,359.58 | - | 27,258.00 | 36,101.58 |
| 5 | එච්.පී.ඒ. ප්‍රේමලාල් | 161,926.02 | - | 29,016.00 | 132,910.02 |
| 6 | පී.ඒ.ආර්. නිලන්ත | 194,998.32 | 82,501.68 | 30,000.00 | 247,500.00 |
| 7 | ඒ.එන්. ඉපලවත්ත | 161,139.70 | - | 30,000.00 | 131,139.70 |
| 8 | එස්.පී. කරුණාසේන | 247,500.80 | - | 30,000.00 | 217,500.80 |
| 9 | පී.එස්.ජී. කුමාරි | 217,495.83 | 57,504.17 | 30,000.00 | 245,000.00 |
| 10 | ඩී.කේ. ආරච්චි | 222,500.32 | 52,500.00 | 30,531.00 | 244,469.32 |
| 11 | ඩබ්ලිව්.කේ. ප්‍රියන්ත | 193,026.00 | - | 30,000.00 | 163,026.00 |
| 12 | ඒ.ඩී.ඩී.එන්. නන්දසේන | 217,500.00 | - | 25,038.75 | 192,461.25 |
| 13 | එස්. මධිවානන් | 135,000.00 | - | 30,000.00 | 105,000.00 |
| 14 | ඒ.එම්.ජී.යූ. අබේකෝන් | 172,500.00 | - | 30,000.00 | 142,500.00 |
| 15 | ජේ.පී.එස්. කුමාර් | 247,500.00 | - | 30,000.00 | 217,500.00 |
| 16 | එච්.පී.එස්. සංගීත් | 207,900.00 | 60,000.00 | 29,775.00 | 238,125.00 |
| 17 | පී. යැෂ්මිනි | 222,500.00 | 52,500.00 | 31,411.50 | 243,588.50 |
| 18 | එන්.කේ.එන්. අමාලි | 222,500.00 | - | 30,000.00 | 192,500.00 |
| 19 | ජේ.එම්. නිරෝජා | 225,000.00 | 47,500.00 | 30,381.00 | 242,119.00 |
| 20 | ඌෂා ඩී. දර්ශනී | 225,000.00 | 50,000.00 | 31,411.50 | 243,588.50 |
| | | **4,018,826.94** | **480,005.85** | **596,662.75** | **3,902,170.04** |

ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන්

| | |
|---|---|
| **2022.01.01** දිනට ශේෂය | **(464,963.24)** |
| 2022 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන් | 2,300,000.00 |
| 2022 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් | **1,835,036.76** |
| 2022.12.31 දිනට ශේෂය | 2,034,822.48 |
| | **(199,785.72)** |

පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන්

| | |
|---|---|
| **2022.01.01** දිනට ශේෂය | **5,877,971.80** |
| 2022 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන් | **28,309,000.00** |
| | **34,186,971,.80** |
| වර්ෂය තුළ පුනරාවර්තන වියදම් | **35,170,291.06** |
| සේවකයින්ට ලබාදෙන ලද ණය සහ අත්තිකාරම් | **640,005.85** |
| 2022.12.31 දිනට ශේෂය | **(1,623,325.11)** |
| වෙනත් - මුදලින් ලද | **2,898,592.23** |
| 2022.12.31 දිනට ශේෂය | **1,275,267.12** |

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

## 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| | | | |
|---|---|---|---|
| 2600 | ආදායම | - | 33,302.85 |
| 2610 | රජයේ ප්‍රදානයන් - ප්‍රාග්ධන | - | 2,300,000.00 |
| 2620 | රජයේ ප්‍රදානයන් - පුනරාවර්තන | - | 28,309,000.00 |
| 2675 | ණය වාරික (උත්සව) | - | 141,246.00 |
| | ණය වාරික (ආපදා) | - | 596,662.75 |
| | ණය පොලී (විශේෂ අත්තිකාරම්) | - | 22,000.00 |
| 2680 | ණය පොලී | - | 157,226.05 |
| 2334 | විශේෂ අත්තිකාරම් පොලී | - | 5,431.60 |
| 2700 | උප අග්‍රිම පියවීම | - | 1,447,222.00 |
| | ගෙවිය යුතු තැන්පතු | 12,275.00 | 177,365.06 |
| | වැටුප් අධිභාර | - | 52,958.40 |
| | | | |
| | **2022.01.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ** | | |
| 2200 | පිරියත සහ යන්ත්‍රෝපකරණ | 108,500.00 | - |
| 2201 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | **2,428,510.89** | - |
| | කෙරීගෙන යන වැඩ | 868,837.50 | - |
| 2203 | කාර්යාලීය ගෘහ භාණ්ඩ | 6,214,106.80 | - |
| 2202 | කාර්යාලීය උපකරණ | 761,725.00 | - |
| 2204 | පරිගණක | 2,598,750.00 | - |
| 2206 | මෝටර් රථ | 6,365,000.00 | - |
| 2203 | වායුසමීකරණ යන්ත්‍ර | - | - |
| | අනිකුත් වත්කම් | - | - |
| | තැන්පතු | - | 85,373.16 |
| | **2022.01.01 දිනට ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන.** | | - |

| | | | |
|---|---|---|---|
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | 21,700.00 |
| | කාර්යාලීය ගෘහ භාණ්ඩ | - | 3,125,764.63 |
| | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | - | 101,187.95 |
| | කාර්යාලීය උපකරණ | - | 155,252.92 |
| | මෝටර් රථ | - | 6,365,000.00 |
| | පරිගණක | - | 1,588,882.92 |
| | වායුසමීකරණ යන්ත්‍ර | - | - |
| | 2022 වර්ෂය සඳහා ක්ෂය කිරීම් | - | - |
| 2207 | ඉන්වෙන්ට්‍රි අයිතම | 103,500.00 | - |
| 2208 | අනිකුත් වත්කම් | 14,950.00 | - |
| 2310 | භාණ්ඩ ලේඛන | 292,900.00 | - |
| 2310 | භාණ්ඩ ලේඛන | 5,000.00 | - |
| 2312 | ලිපිද්‍රව්‍ය | 7,075.00 | - |
| | 2022.01.01 දිනට උප අග්‍රිම පියවීම් | - | - |
| | 2022.01.01 දිනට ලිපිද්‍රව්‍ය තොග | 474,019.74 | - |
| | 2022.01.01 දිනට සේවකයින්ට ලබාදෙන ණය | 4,028,226.94 | - |
| 2311 | ආපදා ණය | 480,005.85 | - |
| 2334 | විශේෂ අත්තිකාරම් | 20,000.00 | - |
| 2332 | උත්සව අත්තිකාරම් | 140,000.00 | - |
| 2342 | අත්තිකාරම් | 1,447,225.00 | - |
| 2400 | 2022.01.01 දිනට සමුච්චිත අරමුදල් | - | 10,567,639.16 |
| | 2022.01.01 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | - | 3,952,612.77 |
| | 2022.01.01 දිනට විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | - | 136,014.00 |
| 2201 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,984,342.00 | - |
| 2202 | කාර්යාලීය ගෘහභාණ්ඩ | 31,980.48 | - |
| 2811 | වැටුප් සහ වේතන | 10,873,697.09 | - |
| 2812 | සේවක අර්ථසාධක අරමුදල (EPF) | 1,552,695.88 | - |
| 2813 | සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (ETF) | 385,820.61 | - |
| 2815 | අතිකාල | 262,960.57 | - |
| 2816 | නිවාඩු දින වැටුප් | 24,597.64 | - |
| 2817 | දීමනා | 3,336,532.11 | - |
| 2831 | ගමන් වියදම් - දේශීය | 67,734.00 | - |
| 2840 | සැපයුම් | - | - |
| 2841 | ලිපිද්‍රව්‍ය | 1,095,689.65 | - |

| | | | |
|---|---|---|---|
| 2842 | පරිභෝජ්‍ය | 25,400.00 | - |
| 2843 | නිල ඇඳුම් | 34,150.00 | - |
| 2844 | පුවත්පත් සහ වාර සඟරා | 395,486.19 | - |
| 2849 | වෙනත් | 353,186.30 | - |
| 2851 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 831,035.00 | - |
| 2852 | රක්ෂණ සහ බලපත් | 197,798.79 | - |
| 2853 | වාහන කුලියට ගැනීමේ ගාස්තු | 2,500.00 | - |
| 2859 | වෙනත් - ප්‍රවාහන | - | - |
| 2861 | ගොඩනැගිලි | 5,285.00 | - |
| 2862 | කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම් | 467,280.60 | - |
| 2864 | පරිගණක නඩත්තු කිරීම් | 600,066.19 | - |
| 2865 | වායුසමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම් | - | - |
| 2866 | මෝටර් රථ නඩත්තු කරීම් | 448,304.68 | - |
| 2882 | කුළී | 7,284,000.00 | - |
| 2883 | දුරකථන සහ අන්තර්ජාල | 434,485.50 | - |
| 2886 | පවිත්‍රතා සේවා | 858,053.46 | - |
| 2887 | ආරක්ෂක සේවා | 1,268,219.96 | - |
| 2888 | තැපැල් ගාස්තු | 67,925.00 | - |
| 3033 | ක්ෂේත්‍ර ගමන් බිමන් | 14,750.00 | - |
| 3040 | පොත් මුද්‍රණය කිරීම් | 5,540.00 | - |
| 3041 | විගණන කමිටු වියදම් | 34,250.00 | - |
| 3042 | මුද්‍රණ | 288,100.00 | - |
| 3050 | වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 839,675.01 | - |
| 3070 | වෙනත් | 22,278.50 | - |
| 3302 | බඳවා ගැනීම් සහ විභාග | 824,470.33 | - |
| 3305 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම් | 601,648.00 | - |
| 2899 | විගණන ගාස්තු | 213,600.00 | - |
| | මුදල් සහ බැංකු ශේෂය | 1,275,267.12 | - |
| | **2022.01.01 දිනට ගෙවිය යුතු** | | - |
| | ලිපිද්‍රව්‍ය (2841) | - | 24,728.30 |
| | වැටුප් සහ වේතන | - | 17,073.55 |
| | දුකථන සහ අන්තර්ජාල (2883) | - | 21,524.21 |
| | තැන්පතු | - | - |
| | පෙර ගෙවීම් - කර්යාල උපකරණ නඩත්තව (2862) | 22,698.00 | - |

| | | | |
|---|---|---|---|
| | ගෙවිය යුතු දුරකථන බිල්පත් | - | - |
| | පවිත්‍රතා සේවා | - | 90,030.06 |
| | ආරක්ෂක සේවා | - | 100,440.00 |
| | කුලී | - | 1,821,000.00 |
| | අනිකුත් ගෙවිය යුතු - 2849 | - | - |
| | මුද්‍රණ (3042) | - | - |
| | ගමන් වියදම් (2831) | - | 1,050.00 |
| | බඳුවා ගැනීම් සහ විභාග (3302) | - | 347,383.39 |
| | ගොඩනැගිලි (2201) | - | 1,291,798.13 |
| | ගෙවිය යුතු අතිකාල | - | 22,604.45 |
| | ගෙවිය යුතු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | - | 86,400.00 |
| | ගෙවිය යුතු ගොඩනැගිලි නඩත්තු කිරීම් | - | 236,237.07 |
| | ගෙවිය යුතු පරිගණක නඩත්තු කිරීම් | - | - |
| | අයකරගත යුතු ආපදා ණය | - | - |
| | එකතුව | **63,402,111.38** | **63,402,111.38** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/C/OLC/FS/01/22/05 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023 මැයි 10 දින

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව / அரச கரும மொழிகள் ஆணைக்குழு / OFFICIAL LANGUAGES COMMISSION 18 MAY 2023

සභාපති

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - 01. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

02. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | PAF/C/OLC/FS/01/22/05 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි /o දින |

සභාපති

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 7 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් ලී බඩු හා කාර්යාල උපකරණ පමණක් ප්‍රත්‍යාගණනය සිදුකර තිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් මූලික වැටුප පමණක් පදනම් කරගනිමින් පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් රු.880,682 ක් අඩුවෙන් පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි.

(ඇ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් රු.78,487 ක ගෙවියයුතු අධිභාර මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් 2016 ජුනි 02 දින කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන එදිනම කොමිෂන් සභාවේ භාවිතයට ලබාදී තිබූ මෝටර් රථයක් 2022 මාර්තු 22 දින රු.4,500,000 කට තක්සේරු කර තිබුණ ද එම රථය කොමිෂන් සභාවට පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද, 2015 ජුනි 24 දින ජාතික භාෂා ව්‍යාපෘතිය සඳහා කැනේඩියන් ඉන්ටර්නැෂනල් ඩිවෙලොප්මන්ට් ඒජන්සිය විසින් කොමිෂම වෙත පවරන ලද යතුරු පැදියේ වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවෙන් කුලියට ගත් ගොඩනැගිල්ලේ රු.993,596 ක් වැයකර ඉදිකරන ලද සේදුම් කාමරයේ වටිනාකම නැවත අයකර ගතයුතු වටිනාකමක් ලෙස ගිණුම්ගත නොකර ප්‍රාග්ධනිතගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

2

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය

යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති විධිවිධානවලට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මුළු පිරිවැය රු. 19,345,430 ක් වූ දේපළ පිරියත හා උපකරණවල එක් එක් අයිතමයන්ගේ පිරිවැය තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**03. වෙනත් කරුණු**

(අ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වූ ජාතික අයවැය චක්‍රලේඛනයේ විධිවිධානයන්ගෙන් බැහැරව කොමිෂම විසින් වාර්ෂික රු.7,284,000 ක බදු කුලියකට කාර්යාල ගොඩනැගිල්ලක් මිලදීගෙන තිබුණි.

(ආ) දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු සඳහා බෙදා හැරීමට 2012 වර්ෂයට පෙර මුද්‍රණය කර තිබූ එහෙත් එම කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් එකතුව රු.292,855 ක් වූ පාරිභාෂික පදමාලා සහ කෙටිකාලීන පාඨමාලා පොත් 3998 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටත් බෙදාහැර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති